
# ගෙවල් බිඳුම්වලට සැක "දංගෙදර සුම්මා"ට මාංචු



(වාද්දුව - දයා හේමන්ත සිල්වා)

**පොලිස් වසම් කිහිපයක ගෙවල් බිඳුම් රැසකට සම්බන්ධ බව කියන 'දංගෙදර සුම්මා' නමැති අන්වර්ථ නාමයෙන් හඳුන්වන පුද්ගලයකු ඉකුත් 11 වැනිදා අත්අඩංගුවට ගත් බව කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය කියයි.**

**ගාල්ල, දංගෙදර ප්‍රදේශයේ පදිංචි 35 හැවිරිදි පුද්ගලයකු මෙලෙස අත්අඩංගුවට ගෙන තිබේ.**

**සැකකරු අත්අඩංගුවට ගෙන කරන ලද ප්‍රශ්න කිරීමේදී ස්ථාන කිහිපයකට ඉතා අඩු මුදලට අලෙවි කර තිබූ ඩීවීඩී ප්ලේයර්, ටෝස්ටර්, රන් භාණ්ඩ, රයිස් කුකර් සහ අත් ඔරලෝසු කිහිපයක් සොයාගැනීමට පොලිසිය සමත්ව ඇත.**

**සැකකරු ගාල්ල ප්‍රදේශයේ සහ වරකාගොඩ පොලිස් බලප්‍රදේශය ඇතුළු ස්ථාන කිහිපයක ගෙවල් බිඳුම් කිහිපයක් සිදුකර ඇතැයි වැටලීමට එක්වූ නිලධාරියෙක් පැවසීය.**

**සැකකරු කළුතර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.**

**කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සනත් කුමාර මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් පරීක්ෂක සුජිත්, උප පොලිස් පරීක්ෂක ඉන්දික මුනසිංහ, සැරයන්වරුන් වන සමන් (28118), රත්නායක (37109), ගුණවර්ධන (44817), කොස්තාපල් නවගමුව (24040) සහ පො.කො.රි. කිත්සිරි යන මහත්වරු (36218) වැටලීමට එක්වූහ.**

# දඬුගම් ඔයට අසූචි බැහැර කිරීම පොලිසියෙන් නවතයි



(ජාඇල විශේෂ - තිස්ස කොටින්කඩුව)

**කලක් තිස්සේ රහසිගතව දඬුගම් ඔයට මහා පරිමාණයෙන් මිනිස් මළ අපද්‍රව්‍ය මුදාහරිමින් කරගෙන ගිය නීති විරෝධී ක්‍රියාවක් ප්‍රදේශවාසීන්ගෙන් ලද පැමිණිල්ලක් මත වටලා අපද්‍රව්‍ය බැහැර කිරීමට යොදා ගෙන තිබූ සිමෙන්තිවලින් බැඳ තිබූ ගලි වළක් සහ කානු පද්ධතිය කොන්ක්‍රීට් දමා වසා දැමීමට කටයුතු කළ බව ජාඇල පොලිසිය පවසයි.**

**මෙම නීති විරෝධී ව්‍යාපෘතිය පවත්වාගෙන ගොස් ඇත්තේ දඬුගම ඔයට මායිමේ පිහිටි පර්චස් 20 භූමි භාගයක බවද පොලිසිය සඳහන් කරයි.**

**සීදුව අමන්දොලුව ප්‍රදේශයේ ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යමින් කටුනායක සහ සීදුව ප්‍රදේශවල කර්මාන්තශාල හා විශාල ව්‍යාපාරික ස්ථානවලින් බැහරවන මිනිස් මළ අපද්‍රව්‍ය තොගපිටින් ගලිබවුසර මාර්ගයෙන් රැගෙන විත් දඬුගම් ඔයට හෙළන ව්‍යාපාරයක් කරගෙන යන බව දඬුගම ප්‍රදේශවාසීන් ජාඇල පොලිසියට පැමිණිලි කොට තිබුණි.**

**ජාඇල පොලිසියේ වැඩබලන ස්ථානාධිපති ගැමුණු ගුණරත්න මහතාගේ මෙහෙයවීම මත පරිසර අංශයේ ස්ථානාධිපති ප්‍රියන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරීහු පිරිසක් මෙම වැටලීම සිදු කළහ.**

**සිද්ධියට සම්බන්ධ ව්‍යාපාරිකයා ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලබාගත් බව කියන බලපත්‍ර සතියක් තුළ පොලිසියට ඉදිරිපත් කරන ලෙස ද මෙහිදී නියෝග කොට ඇත.**

## අපේක්ෂා රෝහලට කොරෝනා වාට්ටු සංකීර්ණයක්



ඉදි කළ නව වාට්ටු සංකීර්ණය ඇමැතිවරයාගේ නිරීක්ෂණයට ලක්වූ අයුරු. (ඡායාරූපය- ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න)

**(මත්තේගොඩ - ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න, මහරගම - ගාමිණී සරත් ගුණවර්ධන සහ දෙහිවල - එච්.එම්. ධර්මපාල)**

**ජාතික තරුණ සේවා සභාව අභිනවයෙන් ඉදිකළ අංගසම්පූර්ණ කොවිඩ් වාට්ටු සංකීර්ණයක්, මහරගම අපේක්ෂා රෝහලට භාර දීමේ උත්සවයක් තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් 9 වැනිදා මහරගම අපේක්ෂා රෝහල් පරිශ්‍රයේදී සිදු කෙරිණි.**

මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී, කොරෝනා වයිරසය ආසාදනය වන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඇඳන් 40 යුත් මෙම අංගසම්පූර්ණ ප්‍රතිකාර මධ්‍යස්ථානය අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර මහතා වෙත භාරදීම මෙහිදී සිදුවිය.

ජාතික තරුණ සේවා සභාව, මගින් ඉදිකළ මෙම නව වාට්ටු සංකීර්ණය සඳහා යෞවන සමාජ සම්මේලනය, සිවිල් ආරක්ෂක අධිකාරිය ඇතුළු ආයතන කිහිපයක අනුග්‍රහක දායකත්වය ලැබී තිබූ අතර ඒ සඳහා අනුග්‍රහක දායකත්වය ලබාදී තිබූ ආයතන නියෝජිතයින්ගේ සේවය අගයා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා අතින් තිළිණ ප්‍රදානයන් සිදුකෙරිණි.

මෙම අවස්ථාවට තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ, මහරගම අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර, ජාතික තරුණ සේවා සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ දමිත වික්‍රමසිංහ , තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජයරත්න, සිවිල් ආරක්ෂක බළකායේ මේජර් ජෙනරාල් රංජන් ළමාහේවා, යෞවන සමාජ සම්මේලනයේ ලේකම් දිල්ශාන් ජයකොඩි, අපේක්ෂා රෝහලේ පරිපාලන නිලධාරීන්, විශේෂඥ වෛද්‍යවරුන්, හෙද හෙදියන්, කනිෂ්ඨ කාර්යය මණ්ඩලය, සේවක සේවිකාවන් ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

## මහඅරුග්ගොඩට ප්‍රජා මණ්ඩලයක්

(පානදුර - උපාලි අලුත්ගේ)

**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පරිසර හා ප්‍රජා සංවර්ධන අංශය මගින් මහ අරුග්ගොඩ සුජනසෙත් ප්‍රජා මණ්ඩලය පිහිටුවා ගැනීම පසුගියදා අරුක්ගොඩ ශ්‍රී ඉන්ද්‍රසාරාරාම මහා විහාරස්ථ ධර්ම ශාලාවේදී සිදු කෙරිණි.**

විහාරාධිපති අඹේගොඩ පියරතන හිමියන්ගේ අනුශාසනා පරිදි පැවැති මෙම රැස්වීමේදී බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපති දේවේන්ද්‍ර පෙරේරා මහතා ගමකට ප්‍රජා මණ්ඩලයක ඇති අවශ්‍යතාව පිළිබඳව විස්තර කළේය. ඉන් අනතුරුව නිලධාරි මණ්ඩලය සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත්කෙරිණි.

සභාපති එච්.කේ.ඒ. චින්ත ජයදේව, ලේකම් උපාලි ජයරත්න, භාණ්ඩාගාරික එච්.සී. තුෂාර කැළුම්, උප සභාපති ජේ.ඒ.ඩී. ජස්ටින්, උප ලේකම් අයි.එස්. ආරච්චි සහ ප්‍රියන්ත අල්විස්, ටී.කේ. විජේසූරිය, පාලිත පෙරේරා, සුමිත් ජයවීර යන මහත්වරු කාරක සභාව ලෙස පත්වූහ. ප්‍රජා සංවර්ධන නිලධාරිනී ජී.ටී. ප්‍රියන්ති මහත්මිය සභාව මෙහෙයවූවාය.

## කඩවත සති පොළට සහ පාරට කැළි කසළ ගොඩ ගහලා

(මහර - ගණිඳු රෝචන සමරතුංග)

**කඩවත අන්දේ අච්ලිනු දේවස්ථානයේ පිටුපස පිහිටි මාර්ගයට විවිධ පුද්ගලයන් විසින් කැළි කසළ බැහැර කිරීම නිසා දැඩි දුගඳක් හමන බව ප්‍රදේශවාසීහු කියති.**

කඩවත සති පොළට ගමන් ගන්නා මාර්ගයේ බියගම සහ මහර ආසනවල මායිම් ප්‍රදේශයට මෙසේ කැළි කසළ ගෙනවිත් බැහැර කර ඇති බව ප්‍රදේශවාසීහු පවසති. කැළි කසළ එම ස්ථානයෙන් නිසි පරිදි ඉවත් කර එම ස්ථානයට කැළි කසළ බැහැර කරන පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රදේශවාසීහු අදාළ අංශවලින් ඉල්ලා සිටිති.



## දුම්රිය තාක්ෂණ ශිල්පියාගේ ත්‍රිරෝදය ඉස්සූ දෙදෙනා අත්අඩංගුවට

(මොරටුව - රේඛා තරංගනී ෆොන්සේකා)

**දුම්රිය දෙපාර්තමේන්තු තාක්ෂණික ශිල්පියකුගේ ත්‍රිරෝද රථයෙන් කුලී ගමනක් යන්නට අවශ්‍ය බව පවසමින් තාක්ෂණ ශිල්පියා සමග මගට ගොස් ඔහුට පහරදී ත්‍රිරෝද රථය කොල්ල කා පලා ගිය තාක්ෂණ ශිල්පියා හොඳින් දන්නා හඳුනන සැකකරුවන් දෙදෙනකු ඉකුත් 12 වැනිදා අත්අඩංගුවට ගත් බව මොරටුව එගොඩඋයන පොලිසිය පවසයි.**

ලැබුණු පැමිණිල්ලකට අනුව මෙම සැකකරුවන් දෙදෙනා සමග ත්‍රිරෝද රථය අත්අඩංගුවට ගත් බව ද පොලිසිය කියයි.

තාක්ෂණ ශිල්පියා සිය මිතුරකු හා වෙරළ තීරයේ මත්පැන් පානය කර ඇති අතර එතැනට පැමිණි දන්නා හඳුනන මෙම සැකකරුවන් දෙදෙනා ගමනක් යෑමට යැයි ත්‍රිරෝද රථය ඉල්ලා ඇති බවත් පොලිසිය පවසයි.

එහිදී ත්‍රිරෝද රථය දෙන්නට නොහැකි බවත් අවශ්‍ය නම් යන්නට ඕනෑ ස්ථානයට ගිහින් ඇරලවන්නම් යැයි තාක්ෂණ ශිල්පියා පවසා ඇති බව පොලිසිය පැවසීය.

එම අවස්ථාවේ දෙදෙනාම ත්‍රිරෝද රථයෙන් ගමන ආරම්භ කර ඇති අතර ටික දුරක් ගොස් මොරටුව අවන්හලක් ළඟ ත්‍රිරෝද රථය නවත්වා එතනින් එහාට යන්නට නොහැකි බව සැකකරුවන්ට පවසා ඇති බව පොලිසිය පැවසීය.

එහිදී තාක්ෂණ ශිල්පියාට පහරදුන් සැකකරුවන් දෙදෙනා ත්‍රිරෝද රථය ගෙන පලා ගොස් සිටියදී අත්අඩංගුවට ගත් බව පොලිසිය පැවසීය.

මෙම සැකකරුවන් මොරටුව ජයගත්පුර ප්‍රදේශයේ පදිංචිකරුවන් බව සඳහන් කරන පොලිසිය මොවුන් නිසියාකාරව රැකියාවක් නොකරන පින්තාරු කර්මාන්තයේ සහ කුලීකරුවන් ලෙස සේවයේ යෙදෙන්නන් බව පැවසීය.

මෙම සැකකරුවන් අවුරුදු විසිහත විසිඅට වියේ පසුවන්නන් බව පොලිසිය පැවසීය.

සැකකරුවන් මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

මෙම වැටලීම ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කමල් පුෂ්පකුමාර මහතාගේ අධීක්ෂණයෙන් මොරටුව එගොඩඋයන පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අනිල් මාසකෝරාළ මහතාගේ උපදෙස් මත අපරාධ අංශ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ප්‍රබෝධ මහතා සිදු කළේය.

## කිරිඳිවැල ටවුමේ කානු සුද්ද කරයි



(කිරිඳිවැල - උපාලි රණවීර)

**වර්ෂා අවස්ථාවලදී කිරිඳිවැල නගරයේ කානු පද්ධතිය උතුරා නගරය යට වීමේ තත්ත්වය වළක්වාලීමේ පියවරක් ලෙස නගරයේ කානු පද්ධතිය තුළ සිරවී තිබූ අපද්‍රව්‍ය ඉවත්කොට කානු පද්ධතිය පිරිසිදු කිරීමේ වැඩසටහනක් ඉකුත් දින පැවැත්විණ.**

දෙම්පෙ ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන කාරියප්පෙරුම මහතාගේ මූලිකත්වයෙන් සභා කාර්ය මණ්ඩලය එක්ව සිදුකරන ලද මෙම වැඩසටහන සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය හා කිරිඳිවැල පොලිසියේ සහය ලැබී තිබිණ. මෙහිදී එම කානු පද්ධතිය තුළ ගොඩගැසී තිබූ සියලුම අපද්‍රව්‍ය කැලිකසළ ඉවත් කිරීමට පියවර ගනු ලැබිණ. වර්ෂා කාලයට නාගරික ජනතාව මෙන්ම නගරයට පැමිණෙන ජනතාව පත්වන පීඩාකාරී තත්ත්වය සලකා බලා මෙම පියවර ගත් බව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මෙහිදී පැවසීය.

මේ අවස්ථාවට ප්‍රාදේශීය සභා ලේකම් අජිත් රණසිංහ මහතා ද සහභාගි විය.

## මීවල දෙදරු පියා කොරෝනාවෙන් මරුට

(වාරණ - ආනන්ද ඉ. ජයකොඩි)

**මීවල ගම්මානයේ පදිංචිව සිටි පනස් හය හැවිරිදි දෙදරු පියකු කොවිඩ් ආසාදනයෙන් පෙරේද (10) පස්වරුවේ මියගොස් ඇතැයි අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසයි.**

මොහු වයිරසය ආසාදනය වී ගම්පහ රෝහලට ඇතුළත් කොට සිටියදී මිය ගොස් ඇතැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සඳහන් කළේය.

මියගිය දෙදරු පියාගේ නිවසේ පදිංචි තවත් සිව් දෙනකු ආසාදිත බවට එම කලාපය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක ඩබ්ලිව්.ඇල්.පී. මංජුල මහතා ප්‍රමුඛ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කළ පරීක්ෂණවලදී හෙළි වී යැයි සෞඛ්‍ය අංශ ප්‍රකාශකයකු සඳහන් කළේය.

මීවල හා මීවල බටහිර ගම්මාන දෙකෙහි නිවාස අටක දෙළොස් දෙනකු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ ස්වයං නිරෝධායනයට යොමු කර ඇතැයි ද එම ප්‍රකාශකයා කීය.

## කළුතර පහත්බිම් තවමත් යටවෙලා

(කළුතර - සුනිල් එස්. තන්ත්‍රිආරච්චි)

**වැසි තත්ත්වයේ අඩුවීමක් පෙන්නුම් කළ ද කළුතර දිස්ත්‍රික්කයේ පහත් බිම් රැසක් තවමත් ජලයෙන් යට වී පවතින බව කළුතර දිසා ලේකම් ප්‍රසන්න ගිනිගේ මහතා ඉකුත් 12 වැනිදා උදේ කීය.**

ඒ අනුව කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා වසම් 69 ක පවුල් 620 කට අයත් පුද්ගලයෝ 2549 ක් මේ වන විටත් පීඩාවට ලක්ව සිටිති.

අධික වැසි, සුළං හා නාය යාම් හේතුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ නිවාස 56කට අර්ධ හානි සිදුවී තිබේ.

නාය යෑම් දැඩි අවදානම් හේතුවෙන් ඉවත් කළ පවුල් 22 කට අයත් පුද්ගලයන් 85 දෙනකුට ආරක්ෂිත මධ්‍යස්ථාන 3 ක රැකවරණය සලසා ඇත.

පීඩාවට පත්වන්නන්ට පිසූ ආහාර ඇතුළු පහසුකම් ලබාදීමට පියවර ගෙන ඇතැයි ද කළුතර දිසා ලේකම්වරයා කීය.

## මුදලට ඇඟ විකිණූ සිද්ධියේ කතුන්ට ඇප


(ගල්කිස්ස අධිකරණය - දිලංගා ගෝමස්)

**ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් ගල්කිස්ස පොලිස් වසමේ පවත්වාගෙන ගිය මුදලට කාන්තාවන් අලෙවි කරන ස්ථානයක් වටලා අත්අඩංගුවට ගත් සුරූපී කාන්තාවන් සිව් දෙනකු රුපියල් 50,000 බැගින් වූ ශරීර ඇප මත මුදා හැරීමටත් එහි කළමනාකරුවන් ලෙස කටයුතු කළ පුද්ගලයින් දෙදෙනකු රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප මත මුදා හැරීමටත් ගල්කිස්ස මහේස්ත්‍රාත් උදේශ් රණතුංග මහතා ඉකුත් 11 වැනිදා නියෝග කළේය.**

ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගල්කිස්ස සේරම් පාරේ පිහිටි මෙම ස්ථානය වැටලූ බව අධිකරණය හමුවේ කරුණු දක්වමින් ගල්කිස්ස පොලිසිය පැවසීය.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ අම්බලන්ගොඩ, අවුකන, පොළොන්නරුව, ගලේවෙල යන ප්‍රදේශවල පදිංචි වයස අවුරුදු 26ත් 40ත් අතර පසුවන්නන් බව ගල්කිස්ස පොලිසිය අධිකරණය හමුවේ පැවසීය.

කොළඹ ජාතික රෝහලේ සමාජ රෝග සායනයට ඉදිරිපත් වී වෛද්‍ය වාර්තා රැගෙන එන ලෙසට ද මෙහිදී මහේස්ත්‍රාත්වරයා විසින් සැකකාරියන්ට නියෝග කළේය. ලබන ජනවාරි මස 10 වැනි දින මෙම නඩුව නැවත කැඳවීමට නියමිතය.




## සසර කෙටි කරමු

ඉපදෙන මැරෙන සසරෙහි නිති සැරිසරණ
කිසිදින කුසල් නොකරම පව් කම් කරන
අනුවන දනට දහමෙහි නැත රැක වරණ
සැනසුන මැනවි කුසලය දන හට සරන

පණනම් මිනිසගෙ තණ අග පිනි වැන්න
පෙරකම් අනුව හැකිවිය මිනිසකු වන්න
බැතිපෙම් උපදවා කුසලට යොමු වන්න
සදහම් මගෙහි ගොස් සුගතිය පිළිගන්න

ඉමක් කොනක් නොපෙනන සසරෙහි යන්නේ
ඉවක් බවක් නොමැතිව පව් කර ගන්නේ
පිනක් කරගන්න පස්පව් දුර ලන්නේ
දනක් සීලයක් පෙරටුව බවුන් වඩන්නේ

ඉසි කෝ මාන දුරලා තිලකුණු සොයමු
කිසි ද පාපි සිතුවිලි පසු පස නොයමු
නිසි ලෙස දහම් පදවැල් නිතරම ගයමු
රිසි ලෙස සසර කෙටි කරනා මං සොයමු

හැකිනම් තුනී කරනට දම් නීවරණ
සදහම් මගේ ගොස් කළයුතු ආවරණ
පැවතුම් තිබිය යුතු තෙරුවන් සිහි කරන
දස්කම් සහිත වීරිය වේ රැක වරණ

**එස්. හේමනායක**
සියනෑ උයන යක්කල

**ඔබේ නිර්මාණ බස්නාහිර කවි මඩුව "ලංකාදීප" කර්තෘ මණ්ඩලය, අංක 8, හුණුපිටිය හරස් පාර, කොළඹ 02. ලිපිනයට යොමු කරන්න.**

